# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය

## ඇබෑර්තු - අධ්‍යක්ෂ තනතුර

රාජගිරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පවත්නා අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් / නාමයෝජනා, 2020-11-17 වන දින දක්වා කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල පද්ධතියේ හෝ ඉන් පිටත විශිෂ්ඨ අයවලුන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

සෞඛ්‍ය පද්ධතීන්හි සේවය කොට පළපුරුදු අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

අධ්‍යක්ෂවරයා, ආයතනයේ පූර්ණකාලීන නිලධාරියකු වන අතර, ප්‍රධාන විධායක නිලධාරීවරයා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා හා ගිණුම් නිලධාරියාද වේ. ඔහු / ඇය, ආයතනය තුළ විනය පවත්වා ගැනීමේ වගකීම දරයි.

ඔහු / ඇය, නිලවශයෙන්, පාලක මණ්ඩලයේ සභික හා සභාපති වේ. ඔහු / ඇය විසින් ආයතනය වෙත අධ්‍යයන හා පරිපාලන නායකත්වය ලබාදීම අපේක්ෂා කරනු ලබන අතර, අදාළ අමාත්‍යාංශ (එනම්, අධ්‍යාපන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ආදී), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ආයුර්වේද දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතුවේ.

**01. අධ්‍යාපනික සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් හා පශ්චාත් උපාධියක්.

හෝ

වසර පහක (05) කාලයක ආයුර්වේද ඩිප්ලෝමාවක් සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක්.

වසර 10 ක පරිපාලන හෝ කළමනාකරණ පළපුරුද්දක් සතුවීම අමතර සුදුසුකමක් වේ.

**02. වයස :**

අයදුම්කරුවන් / නාමයෝජනා ලත් අය, අදාළ අයදුම්පත් භාරගැනීම අවසන් කරනු ලබන දිනට වයස අවුරුදු 63 කට නොවැඩි විය යුතුය.

**03. වැටුප් පරිමාණය :**

රුපියල් 117,350-13X2700-152,450/- (මසකට) U-AC5 (11) හා තනතුරට අදාළ අනෙකුත් දීමනා.

අයදුම්කරු, විශ්වවිද්‍යාල පනතෙහි අර්ථ දක්වා ඇති පරිදි ගුරුවරයකු වෙතොත් හා ඉහත වැටුපට වැඩි වැටුපක් දැනට ලබන්නේ නම්, ඔහු / ඇය දැනට ලබන වැටුපෙහි පිහිටුවනු ලබන අතර, අධ්‍යයන දීමනා හා අනෙකුත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව චක්‍රලේඛන ප්‍රකාරව වූ දීමනා ද ගෙවනු ලැබේ.

සැ.යු : දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව හා ඉහත මූලික වැටුපට වැඩි වැටුපක් ලබන්නේ නම්, සමාන වැටුප් තලයක පිහිටුවනු ඇත.

පත්කිරීමේ නියමයන් හා කොන්දේසි : 1978 අංක 16 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනත හා 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය ආයතන ආඥා පනතෙහි විධිවිධාන මගින් පාලනය වන අතර, එම පනත යටතේ ක්‍රියාත්මක වේ.

**04. සේවාකාල නියමයන් :**

පත්කරනු ලබන දිනයේ සිට වසර තුනක් (03) සඳහා හෝ වයස 65 වන උපන්දිනය තෙක් හෝ මෙයින් පළමුව යෙදෙන අවස්ථාව දක්වා.

**05. අනෙකුත් ප්‍රතිලාභ :**

i. නිල ප්‍රවාහන පහසුකම්.
ii. සංග්‍රහ දීමනා
iii. විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට දායකත්වය.
iv. සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය.

**06. අයදුම්පත් භාරදීම :**

අයදුම්කරුවන් / නාම යෝජනා ලත් අය විසින්, තමන්ම සකසා ගත් අයදුම්පතක් සමග, උපන්දිනය, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනය සහිතව අයදුම්කරුගේ, ආයතනයේ දියුණුවට ඇති දැක්ම සමග, UGC චක්‍රලේඛය අංක 7/2020 ප්‍රකාරව තමන් මෙම තනතුරට පත්කරනු ලැබුවහොත් අරමුණු ඉටුකරගැනීමට යෝජනා කරනු ලබන කාර්යයන්හි කෙටි විස්තරයක් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු දැනට අධ්‍යක්ෂ තනතුර දරන්නේ නම් ඔහු / ඇය විසින්, ඉහත ලේඛනවලට අමතරව තමන් මෙම තනතුර දැරූ කාලය තුළ දායකත්වය පිළිබඳව උපුටා දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත්, ලියාපදිංචි තැපැලෙන්, නියෝජ්‍ය ලේඛකාධිකාරී, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය යන ලිපිනයට 2020-11-17 දිනට පෙර කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවයේ, සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

අපැහැදිලි හෝ අසම්පූර්ණ හෝ ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් හෝ අදාළ අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී / පාලක මණ්ඩල ලේකම්,**
**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.**
**2020 ඔක්තෝබර් 22.**